පශ්චාත් ගැටුම් තේමාව

centre for poverty analysis

# පශ්චාත් යුද පර්යාලෝකය

පළමු කලාපය – සැප්තැම්බර් 2013

## ජනවාර්ගිකත්වය සහ ප්‍රතිසන්ධානය : මඩකලපු දිස්ත්‍රික් ආවරණය

මොහොමඩ් මුනාස්, ගයත්‍රි ලොකුගේ විසිනි
සංස්කරණය - සෝබනා නල්ලයියා



## හැඳින්වීම

තිස් වසරක සිවිල් යුද්ධයෙන් පසුව රට ඉදිරියට ගෙන යෑම පිණිස ශ්‍රී ලාංකික ජනතාවට සාමූහිකව වැඩ කිරීමේ අවස්ථාවක් උදා විය. මෙය ඉටු කිරීම පිණිස මූලික අවශ්‍යතාවයක් වනුයේ සාම ක්‍රියාවලියයි. සුහදශීලී සබඳතාවන් යළි ඇරඹීම හෙවත් දෙපිරිසක් හෝ ඊට වැඩි පිරිසක් අතර තිබූ අරගල සමථයකට පත් කිරීම සරල බසින් සාමය ලෙස හැඳින්විය හැක. සමාජයීය හා දේශපාලනික සාමය පිළිබඳව අප කතා කරන විට එහි නිර්වචනයන් විවිධාකාර වේ.

ස්ටාඋබ් හා පර්ල්මන් (2001) සහ ස්ටාඋබ් සහ බාර්-ටල් (2003) සාමය පහත සඳහන් පරිදි නිර්වචනය කර ඇත. එනම් එකිනෙකා කෙරෙහි අන්‍යෝන්‍ය පිළිගැනීම මෙන්ම මානසික හැඩගැස්මෙහි වෙනසක් ඇති වීම සාමය වේ. අතීතය පදනම් කරගෙන අනාගතය නිර්වචනය කරනවාට වඩා කලහකාරී කණ්ඩායම් සෑම එකිනෙකාගේ මිනිස්කම් හඳුනාගෙන නිර්මාණශීලී නව සබඳතා ගොඩ නැගීම සාමයෙහි අපේක්ෂාවයි.

සාමය හුදෙකලා ක්‍රියාකාරකමක් නොවන නමුත් ඉලක්කයක් සහිත ක්‍රියාවලියකි. මෙය ආකල්ප, ප්‍රාර්ථනාවන්, චිත්තවේග, හැඟීම්වල වෙනසක් ඇති කරන ගැඹුරු ක්‍රියාවලියක් වන අතර එය බලහත්කාරයෙන් හෝ කඩිනමින් සිදුකල නොහැක. එමෙන්ම සාමය යනු පීඩනයට පත් වූ පිරිස මෙන්ම හිරිහැර පමුණුවන ලද පිරිස්ද ඇතුළුව තවත් බොහෝ පිරිස් සහභාගී වන ඉතා පුළුල් ක්‍රියාවලියකි (TIDEA, 2003).

හිංසනයෙහි බිහිසුණු ප්‍රතිඵලයක් ලෙස මෙම සන්දර්භය තුළ බිඳුනු සබඳතා ප්‍රතිසංස්කරණය කිරීමට මෙන්ම නව සබඳතා ගොඩ නැගීම පිණිස සමාජයේ ඉදිරි ගමන සඳහා බහු ආංශික ක්‍රියාවලියක ඒකරාශිවීම අවබෝධ කරගැනීමට ලෙඩරාක්, කෙලී සහ හැම්බර් විසින් රචිත (රාමයියා සහ ෆොන්සේකා 2006 දී උපුටා දක්වා ඇති පරිදි) යම් රාමුවක් සංවර්ධනය කරන ලදී. එම රාමුවෙහි පාදක වන මූලික කරුණු පහත සඳහන් වේ.

- අතීතය සම්බන්ධව පිළිගැනීම මෙන්ම ඒ පිළිබඳව කටයුතු කිරීම
- ධනාත්මක සබඳතා ගොඩනැගීම
- පැහැදිලි ආකල්පමය සහ සංස්කෘතික වෙනසක් ඇති වීම
- සාමය පිළිබඳ අවබෝධකර ගැනීම පිණිස හරවත් සමාජ ආර්ථික සහ දේශපාලනික වෙනසක් ඇති වීම

ශ්‍රී ලංකාවේ සිවිල් යුද්ධය ඊළාම් දමිළ කොටි සංවිධානය (LTTE) සහ ශ්‍රී ලංකා රජය අතර ඇති වූ අරගලයක් බව පැහැදිලිව දක්නට ඇත. සාම සාකච්ඡා වලදී දමිළ සහ මුස්ලිම් ප්‍රජාව අතර බිඳුනු සබඳතා පිළිබඳ සෑම විටම සලකා බලා නැත. විශේෂයෙන්ම නැගෙනහිර පළාතේ මුස්ලිම් සහ දමිළ ජනතාව අතර සබඳතා ඉදිරියට ගෙනයාමේ අපේක්ෂාවන් පිළිබඳ විමසා බැලීම මෙම සංක්ෂිප්ත පත්‍රිකාවේ අරමුණ වේ.

දමිළ සහ මුස්ලිම් ජනතාව සිය ජාතීන් අතර ඇති වෙනස්කම් සමතුලිත කරමින් සහජීවනයෙන් ජීවත් වූ ශ්‍රී ලංකාවේ නැගෙනහිර පළාතේ, මඩකලපුව දිස්ත්‍රික්කයෙහි දරිද්‍රතා විශ්ලේෂණ කේන්ද්‍රය (සේපා) ආයතනය විසින් සිදු කරන ලද අධ්‍යයනයක් පදනම්ව මෙම සංක්ෂිප්ත පත්‍රිකාව සකසා ඇත. ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් ඉතා මෑතකදී එනම් 2012 ලබාගත් දත්ත අනුව ශ්‍රී ලංකාවේ මඩකලපුව දිස්ත්‍රික්කයෙහි ජනගහනයෙන් 72.6% ක් ශ්‍රී ලංකික දමිළ ද 25.5% ක් ශ්‍රී ලාංකික මුස්ලිම් ජනතාවද වන අතර සිංහල ජනතාව ද ඉතාමත් අවම ප්‍රමාණයක් එනම් 1.2% ක් ජීවත් වේ. මෙම සංක්ෂිප්ත පත්‍රිකාවට පදනම් වූ අධ්‍යයනය 2010 වසරේදී ඔක්ස්ෆර්ඩ් විශ්වවිද්‍යාලයේ අසමානතා මානව ආරක්ෂාව සහ ජාතිවාද පිළිබඳ පර්යේෂණ මධ්‍යස්ථානය (CRISE) සහ දරිද්‍රතා විශ්ලේෂණ කේන්ද්‍රය ඒකරාශීව සිදු කරන ලදී. එහි අරමුණ වූයේ කණ්ඩායම් පදනම් වූ තිරස් අසමානතා පිළිබඳ අවබෝධයක් ලබා ගැනීම මෙන්ම සංවර්ධන මැදිහත්වීම් සහ 2008-2009 සිදු වූ අරගලය සම්බන්ධයෙන් එහි බලපෑම විමසා බැලීම වේ.

## දමිළ සහ මුස්ලිම් ප්‍රජාව අතර එදිරිවාදිකම් නිර්මාණය වූයේ කුමක් නිසාද?

දශක ගණනක් මුළුල්ලේ දමිළ හා මුස්ලිම් ජනතාව අතර කැකෑරෙමින් තිබූ චිත්තපීඩාවන් තීව්‍ර කිරීමට පෙරමුණ ගන්නා ලද්දේ ශ්‍රී ලාංකික රජය සහ එල්.ටී.ටී.ඊ. සංවිධානය අතර පැවති යුද්ධය වේ. දහනම වන සියවසේ පටන් මුස්ලිම් යනු වෙනත් ජාතික කණ්ඩායමක්ද එසේ නැතහොත් සම්පූර්ණයෙන්ම වෙනත් ආගමක් අදහන කණ්ඩායමක්ද යන්න පිළිබඳ විවාද පවතී. 1885 දී දමිළ නායක පොන්නම්බලම් රාමනාදන් මුස්ලිම් ජාතීන්ගේ ජාතික අනන්‍යතාවය පිළිබඳ ගැටළුව ඉස්මතු කරන ලද අතර ඔවුන් වෙනම කණ්ඩායමක් ලෙස වෙනම නියෝජනයක්[1] තිබිය යුතු බව පවසන ලදී. මැක්ගිල්වරේ (2008) දී නැගෙනහිර ප්‍රජාවගේ වැදගත් ගති ලක්ෂණයන් හෙළිදරව් කිරීමට උත්සහ කරන ලදී. එනම් මුස්ලිම් ජනතාවගේ දමිළ නොවන අනන්‍යතාවයක් ගොඩ නැගීම හෝ මුස්ලිම් ජනතාවගේ අදහස් හා විශ්වාස වලට ගැළපෙන ජීවන රටාවට හා සංස්කෘතික නිගමනයන්ට අනුකූල ඉස්ලාම් ආගම පදනම් ව පවතින අනන්‍යතාවයක් ගොඩනැගීමේ පැහැදිලි උනන්දුව වේ. අතීතයේදී දමිළ ප්‍රජාව මෙය සෘණාත්මකව නැතහොත් අසුභවාදීව නිරීක්ෂණය කළ නමුත් ශ්‍රී ලංකාවේ යුධ ගැටුම් තීව්‍ර වූ විට මෙම ගැටළුව ඉදිරියට ගෙන එන ලදී.

ශ්‍රී ලංකාවේ ඉතා මෑත අතීතයේ දී දේශපාලන හා ආර්ථික වාසි ලබා ගැනීම සඳහා මුස්ලිම් ප්‍රජාව දෙමළ ප්‍රජාව අබිබවා සිංහල ප්‍රජාවට සහයෝගය දුන්හ. මේ හේතුවෙන් එල්.ටී.ටී.ඊ. සංවිධානය උතුරු නැගෙනහිර ස්වාධීන රාජ්‍යයක් ඉල්ලීම සම්බන්ධව මුස්ලිම් ජනතාව උද්වේගකාරී විරෝධතාවයක් පළ කළහ (ඉම්ටියාස් 2008). මෙම දේශපාලනික ආර්ථික සන්දර්භය තුළ සිංහල දේශපාලනික න්‍යාය පත්‍රය කෙරෙහි මුස්ලිම් දේශපාලන විශාරදයින්ගේ මනාපයක් තිබුන බවද මේ පිළිබඳ සාකච්ඡාවලදී නැගෙනහිර පළාතේ අතීත සිද්ධීන් විස්තර කිරීමේ ලා ඔවුහු ආධිපත්‍යය පැතිරූ බවද පැහැදිලිව විද්‍යාමාන විය. 1997 දී ඉස්මායිල් විසින් රචිත ඉම්ටියාස් 2008දී (පිටු අංක 408) හි උපුටා දක්වා ඇති පරිදි නිදහසට පෙර දේශපාලන විශාරදයන් විසින් මුස්ලිම් ජාතිකයන් දමිළ ජාතිකයන් හට වෙනස් වූ පැහැදිලි කණ්ඩායම් අනන්‍යතාවයක් පවත්වාගෙන යෑම උදෙසා

[1] එම්.එම්.එම්.කාමිල් අසාද් රචිත බ්‍රිතාන්‍ය පාලනය යටතේ ශ්‍රී ලංකාවේ මුස්ලිම් ප්‍රජාව යන කෘතියෙන් උපුටා දක්වා ඇති පරිදි (නවදිල්ලිය, 1993) http://www.crisisgroup.org/~/media/Files/asia/south-asia/sri-lanka/134_sri_lanka_s_muslims_caught_in_the_crossfire.pdf

මුස්ලිම් ආගමික විශ්වාස මත පදනම් වූ අනන්‍යතාවයක් සාර්ථකව නිර්මාණය කරන ලදී. එහෙත් අරගලයේ ආරම්භක අවධියේදී දමිළ බස කථා කරන මුස්ලිම් ජාතීන් දමිළ ජාතිකයින්ගේ අපේක්ෂාවන්ට සහයෝගය දුන් බවට සාක්ෂි ඇත. (ජාත්‍යන්තර අර්බුදකාරී කණ්ඩායම 2007: ඉම්ටියාස් 2009, ඉම්ටියාස් සහ හූලේ 2011)

1985 දී දමිළ සටන්කාමී කණ්ඩායම් විසින් නැගෙනහිර මුස්ලිම් ජනතාවගෙන් බලහත්කාරයෙන් මුදල් පැහැරගැනීමේ උත්සහයන්හි යෙදීම නිසා මුස්ලිම් දමිළ සබඳතාවන් ඉතා දරුණු සන්ධිස්ථානයකට එලඹිණි. මෙය පළමු වරට ප්‍රජාවන් අතර හදිසි යුධ ගැටුම් ඇති වීමට ප්‍රමුඛ විය. පස් වසරකට පසු එනම් 1990 දී මුස්ලිම් ජනතාව ශ්‍රී ලංකාවේ උතුරු ප්‍රදේශයෙන් නෙරපීම නිසා මෙම තත්ත්වය වඩාත් දරුණු අතට හැරුණි. මුස්ලිම් ජනතාවට එරෙහි හිංසනයන් වර්ධනය වී වරින් වර මුස්ලිම් ප්‍රජාවට පහරදීම් ඇරඹුණි. මඩකලපුව දිස්ත්‍රික්කයේ කාත්තන්කුඩි හි සිකුරාදා දින යාඥාවේ නිරතව සිටි මුස්ලිම්වරුන් 103 දෙනෙක් මරා දැමීම මෙම හිංසනය පිළිබඳ කදිම නිදසුනකි. 1990 දී මාස දෙකක් පමණ කාලයක් ඇතුළත එල්.ටී.ටී.ඊ. සංවිධානය විසින් මුස්ලිම් වරුන් 1000ක් පමණ මරා දමා ඇති බව ඇස්තමේන්තු කර ඇත. මෙම ඉලක්කගත හිංසනයන්හි ප්‍රතිඵලයක් ලෙස මුස්ලිම් තරුණයන් හමුදාවට බැඳීම හෝ හමුදාවට තොරතුරු සැපයීමට පෙළඹුනි.

ශ්‍රී ලංකා රජය විසින් ආයුධ සන්නද්ධ මුස්ලිම් තරුණයන් තම අසල්වාසී දමිළ ජනතාවට එරෙහිව ඔත්තු සැපයීමේ කටයුතු සඳහා උපායශීලීව මෙහෙයවීම නිසා මෙම තත්වය වඩාත් සංකීර්ණ තත්වයට එළඹුනි. එහි ප්‍රතිඵලයක් ලෙස හිංසාකාරී සබඳතාවයන් ඇති විය. මෙම අනුක්‍රමික සිද්ධීන් වල ප්‍රතිඵලයක් ලෙස ප්‍රජාවන් දෙක අතර අවිශ්වාසය තදබල ලෙස මුල් බැස ගන්නා ලදී. කෙසේ වුවද, 2007 දී මුස්ලිම් ජනතාව විසින් මුස්ලිම් දේවස්ථාන කමිටු සහ මුස්ලිම් ව්‍යාපාරිකයන්ගේ මූලිකත්වයෙන්, අවතැන් වූ ප්‍රජාවට ආහාර හා ද්‍රව්‍යමය ආකාරයෙන් මානව හිතවාදී සහයෝගයන් ලබා දුන් බව වාර්තාවල සඳහන් වේ.

2007 වසරේදී නැගෙනහිර නිදහස් වූ අතර 2008 දී පළාත් සභා මැතිවරණය පවත්වන ලදී. මෙම සිදු වීම සහ 2009 දී සිදු වූ යුද්ධයේ නිමාව නැගෙනහිර පළාතේ සමාජ දේශපාලනික දර්ශනය සෑහෙන දුරට වෙනස් කිරීමට සමත් විය. දෙමළ ජාතික විමුක්ති කොටි සංවිධානය (TMVP - තමිල් මක්කල් විදුතලෙයි පුලිකල්) ඇරඹීමෙන් ඔවුන් ගේ දේශපාලන ක්‍රියාකාරකම් හිංසන හැඟීම් සමග තරමක් මුසුව තිබුන අතර ඔවුන්ගේ මැතිවරණ ජයග්‍රහණය ද මෙම උද්වේගකාරී තත්වයට එකතු විය. මුස්ලිම් ජාතීන් බහුතරයක් සිටින නගර සභා සහ පරිපාලන දිස්ත්‍රික්ක ඇති කිරීම සඳහා ශ්‍රී ලංකා මුස්ලිම් කොන්ග්‍රසය තම ජන්ද ව්‍යාපාර මෙහෙයවීය. එම නිසා අතීතයේ ඒකරාශීව හෝ මිශ්‍රව තිබූ ජන්ද කොට්ඨාශ සමජාතීය කණ්ඩායම් වශයෙන් එනම් එක් කොට්ඨාශයක් මුස්ලිම්වරුන් සඳහාද අනෙක් කොට්ඨාශය දමිළ ජනතාව සඳහාද වශයෙන් වෙන් කරන ලදී. මඩකලපුව දිස්ත්‍රික්කයේ කල්මුණේ මෙයට නිදසුනකි. ජාත්‍යන්තර අර්බුදකාරී කණ්ඩායම විසින් 2007 දී නැගෙනහිර පළාතේ විවිධ ප්‍රදේශවල හමුදා කණ්ඩායම් විසින් සිදු කරන ලද හිංසන ක්‍රියාවන් පිළිබඳ මෙන්ම මුස්ලිම් ව්‍යාපාරිකයන්ගේ තර්ජන පිළිබඳව ද වාර්තා කර ඇත. විවිධ කණ්ඩායම් වලින් සිදු කළ අසාධාරණකම් පිළිබඳ ඉල්ලීම් දිනා ගැනීම උදෙසා කණ්ඩායම් දෙක විසින්ම සිදු කළ හර්තාලයන්[3] විසඳීමට අවධානය යොමු කරන ලදී. පසු කාලීනව සාර්ථක ලෙස යම් මට්ටමක ස්ථායීතාවයක් යළි ගොඩනැගී ඇති බව විද්‍යාමාන විය.

## කාර්යයන්/වැඩ ඇරඹීම සඳහා පොදුවේ උනන්දුවක් දක්වන කරුණක් තිබේද?

යුද්ධය පැවති සමයෙහි දමිළ සහ මුස්ලිම් දෙපාර්ශවය දරුණු ලෙස බෙදී පැවතුනද නැගෙනහිර ප්‍රදේශයේ මුස්ලිම් සහ දමිළ ජනතාව එකම භාෂාවක් කථා කරන මාතෘමූලික පවුල් ව්‍යුහයක් ඇති සමාන විවාහ ක්‍රමවේද සහ සමාන සිරිත් විරිත් සහ සංස්කෘතික භාවිතයන් ඇති පිරිස් වේ. අතීතයේදී මෙම පිරිස් අතර අසල්වාසී නිවැසියන් බැහැදැකීමට යාම, ආහාර පාන හුවමාරුකර ගැනීම, තෑගි දීම ඇතුළුව සමාජ සංස්කෘතික අන්තර් ක්‍රියාකාරකම් පැවතුනි.

දමිළ ජාතිකයන් මුස්ලිම් ජාතිකයන්ගෙන් වෙනස්ව දක්වන ඉතා වැදගත් සංස්කෘතික අංගයක් වනුයේ ඔවුන් කුල ව්‍යුහය පිළිගැනීම සහ භාවිතා කිරීම වේ. හින්දු ආගමික කුල ක්‍රමය අනුව ස්පර්ශ නොකිරීම යන අදහස පැහැදිලිව පෙන්වා දී ඇති අතර (සිල්වා සහ පිරිස, 2009) ඉස්ලාම් ධර්මය මෙම අදහසට විරුද්ධ වේ. කෙසේ වුවද, නැගෙනහිර පළාතේ මුස්ලිම්වරුන් විශේෂයෙන්ම ඉඩම් හිමිකරුවන් විසින් කරණවෑමියන්, බෙරකරුවන්, රෙදි සෝදන අය, වැනි කුල ආශ්‍රිත (කුටිමල්) ගෘහස්ත සේවා භාවිතා කළ බව පෙනෙන්නට ඇත (මැක්ගිල්විරේ 2008). මෙහිදී පැහැදිලිව පෙනෙන්නට ඇති කරුණක් නම් මෙම ප්‍රජාවන් දෙක අතර පැහැදිලිව දක්නට ලැබෙන ශ්‍රමිකයන්ගේ බෙදීම වේ. එනම් මුස්ලිම් ප්‍රජාව ව්‍යාපාර කටයුතු කෙරෙහි උනන්දුවක් දක්වන අතර සමාජ සංචලනයෙහි උපක්‍රමයක් ලෙස දමිළ ජනතාව අධ්‍යාපනය ලබා විධිමත් ක්ෂේත්‍රයේ රැකියාවන් කිරීමට මනාපයක් දක්වති.

සේපා/ක්‍රයිස් අධ්‍යයනයෙන් පෙන්වා දී ඇති පරිදි සංස්කෘතිය හා භාෂාව වැනි පොදු අංග ලක්ෂණයන් හැරුනු විට මුස්ලිම් හා දමිළ කණ්ඩායම් සිය ජාතික කණ්ඩායම් සමග අන්තර් ක්‍රියාකාරකම් සිදු කිරීමට නැමියාවක් දක්වයි. මඩකලපුව දිස්ත්‍රික්කයේ එරාවූර් පත්තු ප්‍රදේශයේ දමිළ ජාතිකයින් 44.7% ක්ද මුස්ලිම් ජාතිකයන් 38.2% ද ප්‍රකාශ කර ඇත්තේ ඔවුන්ගේ සබඳතා සම්පූර්ණයෙන්ම පාහේ සිය ජාතීන් සමග පවත්වන බවයි. දමිළ ජාතිකයන්ට වඩා (48.7%) මුස්ලිම් ජාතිකයින් වැඩි පිරිසක් (56.9%) යුද්ධයේ නිමාවෙන් පසු අනෙකුත් ජාතීන් කෙරෙහි ඔවුන් තුළ තිබූ දැක්ම බොහෝ දුරට ධනාත්මක වූ බව ප්‍රකාශ කරන ලදී. ප්‍රජා කණ්ඩායම් දෙක අතර හිංසනයන්ගේ නිමාව නිසා මෙම ගුණාංගය ඇති වූ බව සිතිය හැකි අතර ඔවුන් අතර වඩා හොඳ සබඳතාවයක් ඇති කිරීමට අවස්ථාවක් ඇති බව පෙන්නුම් කරයි.

යුද්ධයට පෙර මෙම ප්‍රජාවන් දෙක අතර ජීවනෝපායන් සඳහා අනුගමනය කළ සාම්ප්‍රදායිකව පැවතුන අන්තර් ක්‍රියාකාරකම්වල වෙනසක් නොවීය. ගොවීන් වගාව සඳහා බීජ, තාක්ෂණය, සහ උපකරණ බෙදා හදාගත් අතර කුඹුරු ගොවිතැන් කිරීමේදී වගා කිරීම, අස්වැන්න සැකසීම, අලෙවිය වැනි විවිධ අදියර වලදී ඉතා ඉහල මට්ටමේ අන්තර් ක්‍රියාකාරකම් සිදු විය. පොදුවේ ගත් කල මුස්ලිම්වරුන්ට කුඹුරු ඉඩම්වල අයිතිය තිබූ අතර දෙමළ ජනතාව එම ඉඩම්වල වැඩ කළහ. මඩකලපුව දිස්ත්‍රික්කයේ වෙසෙන

[2] http://temple.academia.edu/ARMImtiyaz/Papers/214574/The_Eastern_Muslims_of_Sri_Lanka_Special_Problems_and_Solutions

[3] හර්තාලය යනු යම්කිසි අරමුණක් ඉටු කර ගැනීම සඳහා තීරකයන්ගේ අවධානය යොමු කර ගැනීම පිණිස ව්‍යාපාර, කඩ සාප්පු, කාර්යාල සහ පාසල් වසා දැමීම

මුස්ලිම්වරු කුඹුරු ගොවිතැන්වල අලෙවි කිරීමේ කටයුතු පිළිබඳ ප්‍රමුඛ ලෙස නිරතව සිටිති.

ජීවනෝපාය සම්බන්ධව තිබෙන මෙම හවුල්කාරිත්වය පොදු සමානත්වයක් මෙන්ම අනුපූරකයක් ලෙස ක්‍රියාකරන බව විද්‍යාමාන වුවද සමහර අවස්ථාවල එක් ප්‍රජාවක් වඩා බලවත් බව පෙනෙයි. නිදසුනක් ලෙස ඉදිකිරීම් ක්ෂේත්‍රයේ කොන්ත්‍රාත්කරුවන් ප්‍රධාන වශයෙන් සිංහල වන අතර ද්‍රව්‍ය සැපයීමේ කටයුතු මුස්ලිම් ජාතිකයන් අතින් ද කම්කරු ශ්‍රමය සැපයීම දමිළ ජාතිකයන් අතින් ද සිදු වේ. මඩකලපුව දිස්ත්‍රික්කයේ ධීවර කර්මාන්ත අංශයේ බහුදින යාත්‍රා මුස්ලිම් ජාතිකයන් සතු වේ. සිත් ගන්නා සුළු පරිදි යුද්ධය විසින් ජාතීන් පදනම්ව අන්තර් ක්‍රියාකාරකම් සහ වෙළඳපොළ කටයුතු මනාව හැඩගස්වා ඇති බවද මෑතකදී සේපා ආයතනය විසින් සිදු කරන ලද අධ්‍යයනයකින් අනාවරණය වී ඇත[4].

නැගෙනහිර පළාතේ වෙළඳපොළ එනම් ගැනුම් හා විකුණුම් වල ආධිපත්‍යය මුස්ලිම් ජාතීන් උසුලයි. එයට හේතුව නම් මුස්ලිම් ජාතිකයන් හට දෙමළ-සිංහල භාෂා දෙකෙන්ම සන්නිවේදනය කිරීමේ හැකියාව වේ. එහි ප්‍රතිඵලයක් ලෙස ඔවුහු හමුදා මුරපොළවලින් ඉතා පහසුවෙන් සංචලනය වීමට ඇති හැකියාව සතුටින් භුක්ති වින්දහ. යුද්ධයෙන් පසු සංචලනය වීමට තිබුනු ප්‍රබල නිදහස නිසා දෙමළ මුස්ලිම් සහ සිංහල ජාතීන් තුනම ආර්ථික කටයුතු සම්බන්ධව වැඩි සහභාගීත්වයෙන් කටයුතු කිරීමට යොමු වූ බව මෑතකදී මඩකලපුව සහ ත්‍රිකුණාමල දිස්ත්‍රික්කවල තෝරාගත් ප්‍රදේශයන්හි සේපා ආයතනය විසින් සිදු කළ අධ්‍යයනයකින් අනාවරණය වේ. නිදසුනක් ලෙස කම්කරුවන්ගේ සංචලතාවය සහයෝගීතාවය සහ සහජීවනය සඳහා සැලකිය හැකි පොදු කරුණක් සේ සැලකිය හැක.

## මෙම ප්‍රජාවන් අතර බෙදීම් වලට හේතුවූයේ කුමක්ද?

මෙම ප්‍රජාවන් දෙක අතර බෙදීම් වලට මූලික හේතුව වූයේ දේශපාලන බලය ලබා ගැනීමේ අරගලය වේ. ඉතාමත් අනුචිත හා අනුකම්පා විරහිත ලෙස බලය පාවිච්චි කිරීම නිසා අවදානම් තත්වයන් සහ චිත්ත පීඩාවන් නිර්මාණය වීම වැඩිදියුණු විය. දේශපාලනයෙහි ප්‍රතිඵලයක් ලෙස චිත්ත පීඩාවන් ඇතිවීමට හේතු වූ බව පෙන්වන කදිම නිදසුනක් වනුයේ 2008 දී පළාතක් සඳහා දමිළ මහාමාත්‍යවරයෙකු පත්කිරීම තුළින් මෙහෙයවනු ලැබූ දමිළ දේශපාලනඥයෙකු වෙඩි තබා ඝාතනය කිරීම වේ. මෙම වෙඩි තැබීම ප්‍රජාවන් දෙක අතර ප්‍රචණ්ඩ ක්‍රියා උද්දීපනය කිරීමට හේතුවිය. දේශපාලන ව්‍යාපාර සැමවිටම සිය ප්‍රචාරක කටයුතු වලදී අතීතයේදී සිදු වූ ජනවාර්ගික වැරදි ඉස්මතු කර දක්වමින් ජාතීන් අතර වෙනස්කම් පවත්වා ගෙන යෑමට උත්සාහ දරන අතර අතීත මිලේච්ඡ ක්‍රියා ජනතා සිත් සතන් තුළ ජීවත් කරවීමට වෙහෙසෙති. ජෙගා (2002) දී තර්ක කරන පරිදි අනන්‍යතාවය උපදව රහිත වුවද, සීමිත සම්පත් තුළින් තම අරමුණු ඉටුකර ගැනීම උදෙසා සමාජ දේශපාලනික බලය අයහපත් ලෙස භාවිතා කළහොත් සත්‍යවශයෙන්ම  එය ජාතීන් අතර බෙදීම් වලට හේතුවිය හැක. නැගෙනහිර පළාතේ මඩකලපුව දිස්ත්‍රික්කයෙහි සත්‍ය වශයෙන්ම සිදුවූයේ මෙම සිද්ධිය වේ. එනම් තම අරමුණු ඉටු කරගැනීම සඳහා දේශපාලන සහයෝගය ලබාගැනීමට ජනවාර්ගික අනන්‍යතාවය භාවිතා කරන ලදී.

මතභේදයට තුඩුදෙන අනෙක් කරුණ භූමිය වේ. වර්තමානයේදී නැගෙනහිර බහුතරයක් මුස්ලිම් ජනතාව ජනඝනත්වය ඉතා වැඩි කුඩා ඉඩම් කට්ටිවල ජීවත් වෙති. මඩකලපු දිස්ත්‍රික්කයේ කාත්තන්කුඩි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය ශ්‍රී ලංකාවේ ජනඝනත්වය වැඩිම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ වලින් එකකි. එහි ප්‍රතිඵලයක් ලෙස දමිළ හා මුස්ලිම් ජාතීන් අතර හෝ සිංහල සහ මුස්ලිම් ජාතීන් අතර බොහොමයක් විරුද්ධවාදීකම් මතුවන අතර එහි අවසානය වනුයේ සීමිත සම්පතක් වන ඉඩම් වලට ඇති තරඟකාරීත්වයයි. නිරන්තරයෙන්ම තර්ක විතර්ක වලට බඳුන් වූ කාත්තන්කුඩි සහ අරයම්පති ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශවල සීමාවන් වෙනස් කිරීම සඳහා මුස්ලිම් සහ දමිළ දෙපිරිසම වෙහෙසෙන අතර කෝවිල් සහ පල්ලි වැනි ප්‍රජාවට අවශ්‍ය ගොඩනැගිලි ඉදිකිරීම තුළින් තම ප්‍රදේශයේ මායිම් පුළුල් කර ගැනීමට උත්සාහ දරති[5].

යුද්ධය අවසන් වී අවතැන් වූ ප්‍රජාව යලි පදිංචි කිරීමේදී ඉඩම් අයිතිය මෙන්ම සමහර නිවාස දේපළ පිළිබඳව ද චිත්ත පීඩාවන් මතුවිය. යුද්ධය පැවති සමයේදී නැගෙනහිර විසු මුස්ලිම් ජනතාව තම දේපල වලට පිවිසීමේ දුෂ්කරතා නිසා ඒවා අතහැර ගිය අතර දමිළ ජාතිකයන් එම ඉඩම් පරිහරණය කිරීමට පටන් ගත්හ. එහෙත් වර්තමානයේදී මුස්ලිම් ජාතික ඉඩම් හිමිකරුවෝ නැවත පැමිණ ඔවුන්ගේ ඉඩම්  අයිතිය ඉල්ලා සිටිති. නැගෙනහිර පළාතේ සිදුවන යළි පදිංචි කිරීමේ කටයුතු වලදී මෙම කරුණ එතරම් අවධානයට යොමු වන බව නොපෙනේ. එසේම රජයෙන්ද ප්‍රදේශයේ ඉඩම් අයිතිය පිළිබඳ ගැටළු විසඳීම සඳහා වෙනසක් සිදු කිරීමට පෙළඹවන සුළු සහයෝගයක්ද නොලැබේ.

## සංජානනය හෙවත් හැඟීම / අවබෝධය යම්කිසි කාර්යයක් ඉටුකරයිද?

සාමය කෙරෙහි බලපාන යථාර්තවාදී අරමුණ සේම සංජානනය හෙවත් හැඟීම ද ඉතා වැදගත් බව සාහිත්‍යයේ අන්තර්ගත කරුණු වලින් තහවුරු වේ. (ස්ටුවට් (සංස්කරණය) 2008, බ්‍රාස් 1993, ඩිප්රෝස් 2009, ඩිප්රෝස්, අබ්දුල් කාදර් සහ තලයාසිංහම් 2010 උපුටා දක්වා ඇති පරිදි). අන්තර් ක්‍රියාවන්ගේ ගුණාත්මකභාවය, සිදුවන වාර ගණන, සහ කාලය  යන කරුණු මෙම සංජානනය හෙවත් හැඟීම් ධනාත්මක ද ඍණාත්මකද යන බව මැනීම සඳහා වැදගත් කරුණ වේ [6].  සේපා/ක්‍රයිස් අධ්‍යයනයෙන් හෙළිවන පරිදි විධිමත් හෝ සංවිධානාත්මක අන්තර්ක්‍රියාවන් සඳහා ඇති අවස්ථාවන් ඉතාමත් අවම වේ. එසේම දමිළ ප්‍රජාවට මුස්ලිම් ප්‍රජා සාමාජිකයන් සමඟ සබඳතා පැවැත්වීමට ඇති අවස්ථා අවම බව මෙම අධ්‍යයනයෙන් තවදුරටත් පෙන්වා දී ඇත. දමිළ ජනතාවගෙන් 49.3% ක්ම ප්‍රකාශ කර ඇත්තේ ඔවුන් මෙන්ම ඔවුන් සමග සේවය කරන සියළුම දෙනාගෙන් බහුතරයන් සිය ජාතිකයින් බවය. වගු අංක 1 හි සඳහන් පරිදි එවැනි තත්වයක් පිළිබඳ ප්‍රකාශ කර තිබුනේ මුස්ලිම් ජාතිකයන් 28.9% ක් පමණි.

4 ජාත්‍යන්තර ස්වේච්ඡා සංවිධානයක් විසින් කරන ලද වෙළඳපොළ අධ්‍යයනය

5 ප්‍රධාන බලධාරීන් සමඟ සිදුකරන ලද සම්මුඛ සාකච්ඡා.

6 වාෂ්නි, ඒ, 2002, ජනවාර්ගික යුද්ධය සහ නාගරික ජීවිතය : ඉතිහාසයේ මුස්ලිම්වරුන් ව හෙවත්   : යේල් විශ්ව විද්‍යාලීය මුද්‍රණාලය

### වගු අංක 1
### ඔබගේ සේවා ස්ථානයෙහි කොපමණ පිරිසක් ඔබ මෙන්ම ඔබගේ ජාතිකයන්ද?

| | ශ්‍රී ලාංකික දෙමළ % | ශ්‍රී ලාංකික මුවර් % |
|---|---|---|
| බොහෝ දුරට සියළු දෙනාම | 49.3 | 28.9 |
| හරි අඩකට වැඩි පිරිසක් | 32.9 | 48.5 |
| හරි අඩක් පමණ | 9.3 | 17.2 |
| හරි අඩකට අඩුවෙන් | 7.2 | 0.0 |
| කිසිවෙක් නැත | 1.3 | 5.4 |

(මූලාශ්‍රය : මූලික දත්ත, සේපා - ඔක්ස්පෝර්ඩ් 2009)

### වගු අංක 2
### ඔබ සමාජ සබඳතා පවත්වන කොපමණ පිරිසක් ඔබ මෙන්ම ඔබගේ ජාතිකයන්ද?

| | ශ්‍රී ලාංකික දෙමළ % | ශ්‍රී ලාංකික මුවර් % |
|---|---|---|
| බොහෝ දුරට සියළු දෙනාම | 44.7 | 38.2 |
| හරි අඩකට වැඩි පිරිසක් | 42.6 | 49.6 |
| හරි අඩක් පමණ | 8.9 | 4.1 |
| හරි අඩකට අඩුවෙන් | 3.0 | 6.1 |
| කිසිවෙක් නැත | 0.8 | 2.0 |

(මූලාශ්‍රය : මූලික දත්ත, සේපා - ඔක්ස්පෝර්ඩ් 2009)

මුස්ලිම් ජාතිකයන් හට වෙනත් ජාතිකයන් සමඟ විධිමත් හා අවිධිමත් ලෙස සම්බන්ධවීමේ අවස්ථා බොහොමයක් තිබෙන බව වගු අංක 1 සහ 2 තුළින් ඉදිරිපත් කර ඇති කරුණු වලින් මනාව පැහැදිලි වේ. එහෙත් ඔවුන් වෙනත් ජාතීන් සමඟ පවත්වන සමාජ සබඳතා විධිමත් සබඳතා වලට වඩා අඩු වේ.

ඔවුන් සබඳතා පවත්වන්නේ තම ජාතියට අයත් නොවන කිනම් අය සමගද යන බව මෙම දත්ත වලින් පැහැදිලි නොවන කරුණකි. වෙළඳුන් වශයෙන් භාෂාව, සබඳතා සීමාකරන සාධකයක් නමුත් මුස්ලිම් ජාතීන්ට සිංහල හා දෙමළ බසින් කථාකිරීමේ හැකියාව ඇත. එහෙත් දමිළ ජාතිකයන් බහුලව සන්නිවේදනය කරනුයේ දෙමළ බසිනි. එම නිසා මුස්ලිම් ප්‍රජාවට බාහිර ජාතීන් සමඟ සබඳතා පැවැත්වීමට ඔවුන්ගේ භාෂා හැකියාව මහත් සේ වාසිදායක වේ.

අවිධිමත් අන්තර් ක්‍රියාකාරකම් වලද මෙවැනි නැමියාවක් හඳුනාගත හැකි බව සේපා/ක්‍රයිස් අධ්‍යයනයෙන් අනාවරණය වී ඇත. දමිළ ජාතිකයින්ගෙන් 44.7% ක්ම ඔවුන්ගේ සමාජ සබඳතා සියල්ලම පාහේ ඔවුන් මෙන්ම සිය ජාතික ප්‍රජාව සමඟ බව ප්‍රකාශ කර තිබුණි. ඒ අතරතුර මෙම ප්‍රකාශයම කරන ලද්දේ මුස්ලිම් ජාතිකයන් 33.2% ක් පමණි. (දත්ත සාරාංශය සඳහා වගු අංක 2 බලන්න.)

මුස්ලිම් ප්‍රජාවේ සාමාජිකයන් හට අනෙකුත් ජාතික කණ්ඩායම් සමඟ නිරන්තර ගනුදෙනු කිරීමට අවස්ථාවක් ලැබීම ඔවුන් වෙනත් ජාතික ප්‍රජාවන් කෙරෙහි වඩා යහපත් හැඟීමක් ඇති කිරීමට හේතු වූ බව පෙනේ. සංසන්දනාත්මකව බලන විට මුස්ලිම් ප්‍රජාවෙන් 56.9% ක් සහ දමිළ ප්‍රජාවෙන් 48.7% ක් අනෙකුත් ප්‍රජාවන් කෙරෙහි තමා තුළ යහපත් හැඟීමක් ඇති බව පවසා ඇත. (මෙම ප්‍රශ්නයට දුන් පිළිතුර සම්බන්ධව වගු අංක 3 බලන්න.) මෙම ප්‍රතිඵලය ජීවිත වලට සෘජු තර්ජනයක් වූ ප්‍රචණ්ඩත්වය නිමා වී වර්තමානයේ පුළුල්ව ව්‍යාප්තව ඇති සාමකාමී පරිසරය නිර්මාණය වීමට හේතු වූ ගුණාංගයක් විය හැක.

වාෂ්නි (2002) දී ඉදිරිපත් කර ඇති පරිදි උසස් මට්ටමේ අන්තර් ක්‍රියාකාරකම් වෙනත් ජාතීන් කෙරෙහි ධනාත්මක හැඟීම් වර්ධනය කිරීමට මෙහෙයවනු ලැබේ. සේපා/ක්‍රයිස් අධ්‍යයනය තුළින් මෙම මතය තහවුරු වේ. එය එසේ සිදුවේ නම් ප්‍රජාවන් දෙක අතර අන්තර් ක්‍රියාකාරකම් වැඩි දියුණු කිරීමට උත්සාහ ගතහොත් එකිනෙකා කෙරෙහි එය වඩා හොඳ ධනාත්මක හැඟීම් නිර්මාණය කිරීමට හේතු වේ. එම නිසා යථාර්ථවාදී අරමුණු සේම හැඟීම්/සංජානනයද ඉතා වැදගත් කාර්යභාරයක් ඉටු කරයි. මෙම උත්සාහය හැඟීම්වල වෙනසක් ඉස්මතු කර වඩාත් සුහදශීලි ප්‍රජා සබඳතාවක් ඇති කිරීමට හේතු විය හැක.

### වගු අංක 3
### වෙනත් ජාතීන් පිළිබඳව ඔබේ ආකල්ප

| | ශ්‍රී ලාංකික දෙමළ % | ශ්‍රී ලාංකික මුවර් % |
|---|---|---|
| නොවෙනස්ව පැවතුනි | 46.8 | 39.1 |
| වඩාත් ඍණාත්මකයි | 4.5 | 4.0 |
| වඩාත් ධනාත්මකයි | 48.7 | 56.9 |

(මූලාශ්‍රය : ප්‍රාථමික දත්ත - සේපා - ඔක්ස්ෆර්ඩ් දරිද්‍රතා විශ්ලේෂණ ආයතනය 2009)

සේපා /ක්‍රයිස් අධ්‍යයන කණ්ඩායම විසින් ඔවුන්ගේ අධ්‍යයනයට භාජනය වූ තොරතුරුදායකයින්ගෙන්, තමන්ගේ දුව / සහෝදරිය / පුතා / සහෝදරයා අන්‍ය ජාතිකයෙකු හා විවාහ වෙනවාට විරුද්ධත්වයක් දක්වන්නේද යන්න අසමින් එවැනි අවස්ථාවකට ප්‍රතිචාර දැක්වීමේදී ඔවුන් අනුගමනය කරන සදාචාරාත්මක මුහුණුවර සහ අන්තර් මානව සම්බන්ධතා විඳගැනීමේ හැකියාවන්ගේ මට්ටම කෙබඳු දැයි සොයා බැලීමේ ප්‍රයත්නයක යෙදෙන ලදී.

ප්‍රතිචාර දැක්වූ මුස්ලිම් ජනයා, දමිළ ප්‍රජාව සම්බන්ධයෙන් ඉහළ සහසම්බන්ධතා අගයක් (වගුව 2 බලන්න) සහ ධනාත්මක ආකල්පයක් (වගුව 3 බලන්න) දරණ ලද නමුත් සැලකිය යුතු බහුතරයක් දමිළ ප්‍රජාව ඔවුන් තම පවුල්වල අය අන්‍ය ජාතිකයන් සමඟ සිදුකර ගන්නා විවාහයන්ට විරුද්ධත්වය ප්‍රකාශ කරන ලදී. (76.6% ක් 50% ක දමිළ ප්‍රජාවට පටහැනිව) ආගමික වෙනස නිසා එම ප්‍රජාව මුස්ලිම් ප්‍රජාවට අකමැති බව ප්‍රකාශ කර තිබේ.

**වගු අංක 4 - තම දුව / සහෝදරිය / පුතා / සහෝදරයා අන්‍ය ජාතිකයෙකු හා විවාහ වීමකදී විරුද්ධත්වය දක්වන්නේද?" ලෙස අසන ලද පැනයට දැක්වූ ප්‍රතිචාරයන්හි සාරාංශය**

| | ඔබේ දුව / සහෝදරිය අන්‍ය ආගමිකයෙකු හා විවාහ වනවාට ඔබ විරුද්ධත්යක් දක්වන්නේද? | | ඔබේ පුතා / සහෝදරයා අන්‍ය ආගමිකයකු හා විවාහ වනවාට ඔබ විරුද්ධත්වයක් දක්වන්නේද ? | |
|---|---|---|---|---|
| | ශ්‍රී ලාංකික දෙමළ % | ශ්‍රී ලාංකික මුවර් % | ශ්‍රී ලාංකික දෙමළ % | ශ්‍රී ලාංකික මුවර් % |
| නැත | 50 | 23.4 | 50.4 | 23.4 |
| ඔව් | 50 | 76.6 | 49.6 | 76.6 |

(මූලාශ්‍රය : ප්‍රාථමික දත්ත - සේපා ඔක්ස්ෆර්ඩ් - 2009)

## ඉදිරි ගමන් මග

නැගෙනහිර පළාතෙහි වෙසෙන ත්‍රිවිධ ජනවාර්ගිකයන් අතර සාමය ගොඩනැගීමෙහිලා ඇතැම් සංවිධාන වාර්තාගත ලෙස ක්‍රියා කරමින් පවතී. බුද්ධ ධර්මය, කිතු දහම, හින්දු ආගම සහ ඉස්ලාම් ආගම යන සිවු ආගමික නායකවරුන් සමග ක්‍රියාකාරී සංවිධානයන් පවතින අතර මෙම සංවිධාන, තරුණ පිරිස්, ධීවරයන් හෝ වෙළෙඳුන් ආදී විවිධ වූ කණ්ඩායම් සමග එකතුව ක්‍රියා කරයි. කෙසේ වුවත් මෙම සංවිධාන සාමුහික උත්සාහයකින් තොර හුදකලාවූ ඒවා ලෙස ක්‍රියාත්මක වනබව පෙනී යයි. මෙම උත්සහයන් මනා සංවිධානාත්මක ශක්තියකින් යුතු සහසම්බන්ධතාවයකින් සමන්විත වන්නේ නම් එය වඩා ශක්තිමත් අන්තර් ප්‍රජා සම්බන්ධතාවයක් සඳහා වඩා තිරසාර වූ පශ්චාත් යුධ සාමයක් ගොඩ නැගීමේ ක්‍රියාවලියක් සඳහා හේතු වනු ඇත.

ධනාත්මක අන්තර් සම්බන්ධතාවයක් සහ සාමය ගොඩ නැගීමක් සඳහා මනා අවධානයකින් යුතු ප්‍රයත්නයක් සහ කාලයක් නැවත විශ්වාසය ගොඩනැගීමෙහිලා ආයෝජනය කළයුතු බව සාහිත්‍යය අනුසාරයෙන් ඉදිරිපත් වී ඇත [7]. සේපා/ක්‍රයිස් අධ්‍යයනය පෙන්වා දුන් පරිදි ධනාත්මක සම්බන්ධතාවයක් ගොඩනැගීම සඳහා මනා සහසම්බන්ධතාවයක් අවශ්‍ය බවත් එකී කාරණාව මත සාමය ගොඩනැගීම සඳහා සහසම්බන්ධතාවයන්ට ඉඩ ප්‍රස්ථා සැළසෙන විවිධ අවස්ථාවන් නිර්මාණය වීම වැදගත් වන බව ප්‍රකාශවේ.

විශේෂයෙන්ම ප්‍රතිපත්ති සම්පාදකයන් සහ ක්‍රියාත්මක කරන්නන් එමගින් දමිළ සහ මුස්ලිම් ප්‍රජාවන්හි තරුණ කණ්ඩායම් අතර සහසම්බන්ධතාවයන් දිරි ගැන්විය යුතු බව නිර්දේශ වේ. යුද්ධය හා ගැටුම් පිළිබඳව මිස වෙනත් කිසිවක් පිළිබඳව නොදන්නා තරුණ පරම්පරාවක් නැගෙනහිර පළාත සතුව ඇත. මෙම තරුණ කාන්තාවන් සහ පුරුෂයන්ට විවිධ ජාතීන්ගෙන් සමන්විත පසුබිමක හිඳීමට සහ සහසම්බන්ධතාවය ගොඩනගා ගැනීමට හැකියාව ලබා දීම තුළින් "අන්‍යයන් " පිළිබඳව වඩාත් ධනාත්මක ආකල්ප ඇති කර ගැනීමටත්, පැරණි පරම්පරාවන්හී මත වාදයන්ට අභියෝගයක් බවට පත්වෙමින් "වෙනසෙහි නියෝජිතයන්" සහ "අනාගත නායකයන් " බවට පත්වීමේ හැකියාව ඇත.

එමෙන්ම, ජන කණ්ඩායම් දෙකටම විත්ත පීඩා ගෙන දෙන ආකාරයේ පැරණි ආකෘතිකමය හැගීම් සහ ආකල්ප සඳහා ජනමාධ්‍ය හරහා අභියෝග කිරීමද වැදගත්ය. මුස්ලිම් සහ දමිළ යන දෙවර්ගයම පොදු භාෂාවක් භාවිතා කරන බැවින් ඔවුන්ගේ සෘනාත්මක හැගීම් සහ ආකල්ප නැසීම සඳහා දමිල භාෂාමය ජනමාධ්‍යයන්ට අවස්ථා උදාකර ගත හැකිව තිබේ.

අතීත සිදුවීම් පිළිගැනීම සහ උපයෝගී කර ගැනිම තුළින් මිස සාමය ගොඩ නැගිය නොහැකි බව සාකච්ඡාවලින් මතු වේ. මෙහිදී සාකච්ඡාවට බඳුන්වූ විශේෂ අවස්ථාවෙන් පැහැදිලි වන පරිදි "අතීත සිදුවීම් උපයෝගී කරගැනීම " හෝ "සත්‍ය සොයා යෑම ", "පැරණි තුවාල විවර කිරීමක් " සහ මතකයෙන් ඇත්ව තිබූ "පැරණි ගැටුම්කාරී වාතාවරණයන් " නැවත අළුත් කිරීම සඳහා අවස්ථා උදාකරන්නකි. එම නිසා සත්‍ය සෙවීමේ අවශ්‍යතාවය සංවේදී ලෙස ක්‍රියාත්මක කළ යුතු සහ ප්‍රාදේශිය මට්ටමින් පමණක් විවරණය කළයුතු එකක් පමණක් වේ.

## සාමය ගොඩනැංවීමේ ක්‍රියාවලිය සඳහා එළඹිය හැකි අභියෝග

නැගෙනහිර පළාත සංවර්ධනය සඳහා වන සංවර්ධන සැළසුම සඳහා දමිළ සහ මුස්ලිම් ජනතාවගේ මානසික පීඩනය සැළකිල්ලට ගනු ලැබුවේද ? යන්න පිළිබඳව පැහැදිලිතාවයක් නොමැත. එම කාරණා සැළකිල්ලට නොගැනීම නිසා වර්තමානයේ යහපත් මට්ටමින් පවත්නා වූ සාමයට බාධාවීමක් සිදුවිය හැකිය.

ඇතැම් රාජ්‍යබලධාරීන් සාමය ගොඩනැංවිමේ ක්‍රියාවලිය දෙස සැක සහිතව බලන අතර, ඒ නිසා මෙම ක්ෂේත්‍රයේ ප්‍රධාන භූමිකාවන් උසුලන්නාවූ පුද්ගලයන් ක්‍රියාකාරී අන්දමින් තමන්ගේ බලය මේ සඳහා සම්බන්ධ කළයුතුව ඇත. රාජ්‍ය පිළිගැනීමට පාත්‍රවීම මෙම ක්‍රියාවලිය සාර්ථක කර ගැනීමෙහි ලා වැදගත් කාරණයක් වනු ඇත. සාමය ගොඩනැංවිමේ ක්‍රියාවලිය හා සම්බන්ධවී සිටින ක්‍රියාකරුවන් ඔවුන්ගේ කාර්යයන් සම්බන්ධීකරණය කර ගැනීමේ ක්‍රමවේදය තුළින් එකම කාර්යය නොදැනුවත්ව කිප දෙනෙකු විසින් ඉටු කිරීමට යාමේ ප්‍රයත්නයන් නොදරන බවට තහවුරුවක් ලැබීමෙන් මෙන්ම සාර්ථක අත්දැකීම් හුවමාරු කර ගැනිම තුළින්ද සාමය ගොඩනැංවීමේ ක්‍රියාවලියෙහි සාර්ථකත්වය උපරිම කර ගැනීමේ වැඩි ප්‍රවණතාවයක් ඇත.

අවධානයට ලක්විය යුතු තවත් සංකීර්ණතාවයක් ලෙස තරුණයන් සමග කටයුතු කිරීම සැළකිය යුතුවන අතර ඔවුන් සජීවිකරණ කර්තව්‍යයන්හී යොදා ගැනීමේදී ගැටළු සහගත තත්වයන් ඉදිරිපත් විය හැකිය. තවද පහසුවෙන් හානි විය හැකි සාමයේ සමතුළිතය පිළිබඳව අනතුරු ඇඟවීමක් මොවුන්ට කර තිබීමද අත්‍යවශ්‍ය වනු ඇත.

[7] ලෙඩරාක් සහ පිරිස රචිත රාමයියා, ඩී.ඒ.සහ ෆොන්සේකා, ඩී. උපුටා දක්වා ඇති පරිදි (2006). ශ්‍රී ලංකාවේ සාමය සහ සාම ක්‍රියාවලිය රාමු, අභියෝග සහ ඉදිරි ගමන ප්‍රජාතන්ත්‍රවාදී ප්‍රතිසංස්කරණය සඳහා ප්‍රතිපත්ති විකල්ප. ප්‍රජාතන්ත්‍රවාදය සහ මැතිවරණ සහයෝගය පිළිබඳ ජාත්‍යන්තර ආයතනය, ස්ටොක්හෝම්:ස්වීඩනය

# ආශ්‍රිත ග්‍රන්ථ


Brass, Paul R., 2003. *The Production of Hindu-Muslim Violence in Contemporary India*, Seattle: University of Washington Press.

Centre for Poverty Analysis, 2010. Livelihoods and Market Study: Assessing Conditions in Selected GNs of Batticaloa and Trincomalee Districts (unpublished).

Department of Census and Statistics, 2007. *Special Enumeration for Batticaloa 2007: Basic Population Information on Ampara – 2007*, Preliminary report based on a special enumeration, Department of Census and Statistics, accessed on 22 October 2008, <http://www.statistics.gov.lk/PopHouSat/Preliminary%20Reports%20Special%20Enumeration%202007/Basic%20Population%20Information%20of%20Batticaloa%20District%202007.pdf>

Diprose, R., Abdul Cader, A. and Thalayasingam, P. (forthcoming), *Conflict-Sensitivity, Development Effectiveness, Inequalities, and Conflict in Sri Lanka: Understanding Aid Programming, Voice and Action in Local Conflict-affected Environments*, Centre for Research on Inequality, Human security and Ethnicity, Oxford University, Oxford and Centre for Poverty Analysis , Colombo.

Imtiyaz, M., 2009, The Eastern Muslims of Sri Lanka - Special Problems and Solutions, *Journal of Asian and African Studies*, Vol. 44 (4), pp. 407-427, accessed 01 July 2012, <http://temple.academia.edu/ARMImtiyaz/Papers/214574/The_Eastern_Muslims_of_Sri_Lanka_Special_Problems_and_Solutions>

Imtiyaz, M., and Hoole, H., 2011, Some Critical Notes on the Non-Tamil Identity of the Muslims of Sri Lanka, and on Tamil–Muslim Relations. *South Asia: Journal of South Asian Studies*, Vol. 34 (2), August 2011, pp. 208-231.

International Crisis Group, 2007. Sri Lanka Muslims Caught in the Crossfire, *Asia Report No 134,* accessed 01 July 2012 <http://www.crisisgroup.org/~/media/Files/asia/south-asia/sri-lanka/134_sri_lanka_s_muslims_caught_in_the_crossfire.pdf>

International Crisis Group, 2008. Sri Lanka's Eastern Province: Land, Development, Conflict, *Asia Report No 159*, accessed on 01 July 2012

Jega, A. M., 2002, 'Tackling Ethno-Religious Conflict in Nigeria', *The Nigeria Social Scientist*, Vol. 5 (2), pp. 35-39.

Kamil Asad, M., 1993. *The Muslims of Sri Lanka Under British Rule*, p. 75, New Delhi.

McGilvray, B., 2001. *A History of Ethnic Conflict in Sri Lanka: Tamil and Muslim Identities in the East*, Marga Monograph Series on Ethnic Reconciliation, Marga institute, Colombo,

McGilvray, B., 2008. *Crucible of conflict: Tamil and Muslim Society on the East Coast of Sri Lanka*, Social Scientists' Association, Colombo.

McGilvray, B. and Raheem, M. 2007, *Muslim Perspectives on the Sri Lankan Conflict*, East-West Center Washington, Washington, 01 July 2012 at <http://www.eastwestcenter.org/sites/default/files/private/ps041.pdf>

Peace and Conflict Timeline, accessed 01 July 2012 <http://pact.lk/>

Ramiah, D.A. and Fonseka, D., 2006. *Reconciliation and the peace process in Sri Lanka: frameworks, challenges and ways forward*, Policy options for democratic reform, International Institute for Democracy and Electoral Assistance, Stockholm, Sweden.

Silva, K. T., P. P. Sivapragasam and P. Thanges. 2009. *Caste Discrimination and Social Justice in Sri Lanka: An Overview*, Indian Institute of Dalit Studies, Working paper series - Vol 3 (6), New Delhi, accessed 01 July 2012 <http://idsn.org/fileadmin/user_folder/pdf/New_files/Publications_from_network/Caste_discrimination_and_social_justice_in_Sri_Lanka__IIDS_working_paper_.pdf>

Stewart, F. (ed.) 2008. *Horizontal Inequalities and Conflict: Understanding Group Violence in Multi-ethnic Societies*, London: Palgrave.

Varshney, A., 2002. *Ethnic Conflict and Civic Life: Hindus and Muslims in India*, New Haven, Yale University Press.

දරිද්‍රතා විශ්ලේෂණ කේන්ද්‍රය (සේපා), දිළිඳුකම ආශ්‍රිත සංවර්ධන ගැටළු පිළිබඳ මනා අවබෝධය වැඩි දියුණු කරන ශ්‍රී ලාංකික විද්වත් මණ්ඩලයකින් සමන්විත ස්වාධීන ආයතනයකි. දිළිඳුකම අසාධාරණ වන අතර එය පිටු දැකීම සඳහා ජාතික සහ ජාත්‍යන්තර මට්ටමින් දිළිඳු බවින් පීඩිත ජනතාව සමග වැඩ කිරීමට අමතරව දිළිඳු බව ආශ්‍රිත ප්‍රතිපත්ති සහ භාවිතයන් වෙනස්කිරීම කළ යුතු බව සේපා ආයතනය විශ්වාස කරයි. සේපා ආයතනය තම කාර්යයන් තුළින් ජාතික, ප්‍රාදේශීය, වැඩ සටහන් සහ ව්‍යාපෘති මට්ටමින් දිළිඳුකම ආශ්‍රිත සංවර්ධන ප්‍රතිපත්ති සඳහා බලපෑම් කිරීමට උත්සහ දරයි.

දිළිඳුකම නිසා අනිකුත් අංශ සියල්ලටම බලපාන ඉතා වැදගත් තේමා පහක් යටතේ සේපා ආයතනය තම කටයුතු සිදු කරයි. එනම් පශ්චාත් යුද සංවර්ධන කටයුතු, පොදු පහසුකම් සංවර්ධනය, අවදානම් තත්වයන්, සංක්‍රමණය සහ පරිසරය යන තේමා පහ වේ. පශ්චාත් යුද තේමාවේදී පශ්චාත් යද සංවර්ධන කටයුතු අධීක්ෂණය කිරීම මෙන්ම පවත්නා වූ අසමානතා සහ යුද ගැටුම් තවදුරටත් පාඩු සිදු වීමට හේතු වන කරුණක් ලෙස වර්ධනය කිරීමට නොව තම ආර්ථික වාසි ලබා ගැනීම තහවුරු කිරීම පිණිස රාජ්‍ය සහ රාජ්‍ය නොවන ක්‍රියාකරුවන්ට සහයෝගය දීම සේපා ආයතනය සිදු කරයි.

ISSN No: ISSN 2345-9441

ISSN 2345-9441

9 772345 944004

The Asia Foundation

cepa
centre for poverty analysis
29, R G Senanayake Mawatha,
Colombo 7, Sri Lanka
Tel:+94 (011) 4690200, 2676955
Fax: +94 (011) 2676 959
E-mail: info@cepa.lk
www.cepa.lk